# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1090/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 03/07/2024 පැය 1210

# මාධ්‍ය නිවේදනය

## අධිකරණ නියෝගයක් දැනුම් දීම.

2024.07.03 වන අද දින සමස්ථ ලංකා ගොවිජන සම්මේලනය හා කිරි ගොවින් සුරකීමේ මධ්‍යස්ථානය විසින් මරදාන හා කොටුව පොලිස් වසම්වල මාර්ග වල ගමනාගමනය අවහිර වන පරිදි වාහන වලට හා මහජනතාවට බාධාකාරී වන ලෙසට විරෝධතාවයක් හා පා ගමනක් සිදු කරන බවට ලද බුද්ධි තොරතුරක් මත ස්ථානාධිපති මරදාන විසින් මාලිගාකන්ද ගරු මහෙස්ත්‍රාත් අධිකරණයෙන් සහ කොටුව ස්ථානාධිපතිවරයා විසින් කොටුව ගරු මහෙස්ත්‍රාත් අධිකරණයෙන් මෙම විරෝධතා පා ගමන් වලක්වන ලෙසට කරන ලද ඉල්ලීම් අනුව,

1. නාමල් කරුණාරත්න (සමස්ථ ලංකා ගොවිජන සම්මේලනය ඇතුළු කිරි ගොවීන් සුරකීමේ මධ්‍යස්ථානයේ කැඳවුම්කරු)
2. ටී.බී.සරත් (සමස්ථ ලංකා ගොවිජන සම්මේලනයේ ප්‍රධාන ලේකම්)
3. සුසන්ත කුමාර (කිරි ගොවීන් සුරකීමේ මධ්‍යස්ථානයේ ලේකම්)
4. සුමිත් අත්තනායක (ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ සභාපති)
5. බණ්ඩාර රඹුක්වැල්ල (ශ්‍රී ලංකා පොදුජන සේවක සංගමයේ සභාපති)
6. සෝමසිරි රණසිංහ (ස්වාධීන සේවක සංගමයේ සභාපති)
7. නිලන්ත සිල්වා (සමඟි සේවක සංගමයේ සභාපති) ඇතුළු වගඋත්තරකරුවන් සහ ඔවුන්ගේ නියෝජිතයින්ට

2024.07.03 වන අද දින මරදාන පොලිස් වසමේ ටෙක්නිකල් හන්දියේ සිට කැළෑ පොල දක්වා ද, ටෙක්නිකල් හන්දිය, ඔරාබිපාෂා මාවත, ඩීන්ස් පාර, ඉබ්බන්වල හන්දිය, ඩාර්ලි පාර, ගාමිණී වටරවුම ඔස්සේ නෙළුම් කුළුණ මාර්ගය දක්වා වූ මාර්ග සහ ඒ අවට හා පදික වේදිකා භාවිතා කල නොහැකි ලෙස අහුරමින් දහවල් 0200 සිට උද්ඝෝෂණ හා පෙලපාලි තහනම් කරමින් මාලිගාකන්ද ගරු මහෙස්ත්‍රාත් අධිකරණය මගින් ආඥාවක් නිකුත් කර ඇත.

2024.07.03 වන අද දින කොටුව පොලිස් වසමේ ඕල්කට් මාවත ටෙලිකොම් හන්දියේ සිට සෙරමික් හන්දිය දක්වා ද, සෙරමික් හන්දිය සිට NSA වටරවුම දක්වා මාර්ගය ද, NSA වටරවුමේ සිට බාලදක්ෂ මාවත දක්වා ගාලු වටරවුම ද අවහිර කර ඇතුළුවීම, මුදල් අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාල මාර්ගය සහ ඒ අවට හා පදික වේදිකා භාවිතා

කල නොහැකි ලෙස අහුරමින් උදෑසන 1000ත් සවස 0600ත් අතර කාලයේදී උද්ඝෝෂණ හා පෙලපාලි තහනම් කරමින් කොටුව ගරු මහෙස්ත්‍රාත් අධිකරණය මගින් ආඥාවක් නිකුත් කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**